හිතවත් පාරිභෝගික මහත්මයාණෙනි/ මහත්මියණි,

## <u>ඔබගේ මෝටර් රථ රක්ෂිත මුදලේ ප්‍රමාණවත් බව සම්බන්ධවයි</u>

ඔබගේ රක්ෂණ ඔප්පුව අප සමග අලුත් කිරීම පිළිබඳව අප ඔබට ස්තූතිවන්ත වෙමු. මෙම ලිපිය මඟින් පහත කරුණු පිළිබඳව ඔබව දැනුවත් කිරීමට කැමැත්තෙමු.

වත්මන් වෙළඳපොළ තුල රථ වාහන මිල සැලකිය යුතු අගයකින් ඉහල ගොස් ඇත. ඔබගේ වාහනයට යම් අනපේක්ෂිත අලාභයක් හෝ හානියක් සිදු වුවහොත්, නිවැරදි වන්දි මුදලක් ලබා ගැනීම සඳහා වත්මන් වෙළඳපොළ වටිනාකමට ඔබගෙ වාහනය රක්ෂණය කර තිබීම වැදගත් වේ. එම නිසා ඔබගේ වාහනයේ රක්ෂිත මුදල වතර්මාන වෙළඳපොළ වටිනාකම හා සසඳා බලා අවශ්‍ය පරිදි සංශෝධනය කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ඔබගේ වාහනය වත්මන් වෙළඳපොළ වටිනාකමට රක්ෂණය කර නොමැතිනම්, හිමිකමක් අයදුම් කරන අවස්ථාවේදී ඌණ රක්ෂණ කොන්දේසියට යටත් වේ.

ඌණ රක්ෂණය පහත පරිදී ගණනය කෙරේ,

ලබා දෙන වන්දි මුදල= $\frac{\text{රක්ෂිත මුදල}}{\text{වෙළඳපොළ වටිනාකම}}$ X ඉල්ලා සිටින වන්දි මුදල

උදා: රක්ෂිත මුදල - රු. 1,000,000.00
වෙළඳපොළ වටිනාකම - රු. 2,000,000.00
ඉල්ලා සිටින වන්දි මුදල - රු. 50,000.00

ලබා දෙන වන්දි මුදල = $\frac{1,000,000.00}{2,000,000.00}$ X 50,000.00

= <u>25,000.00</u>

(අනෙකුත් ඔප්පු කොන්දේසි හා නියමයන්ට යටත්ව)

තවද, වාහනය සම්පූර්ණ හානියකට පත් වූ අවස්ථාවකදී, ඔබට ලබාගත හැකි උපරිම වටිනකම වන්නෙ රක්ෂිත මුදලයි. වාහනය වත්මන් වෙළඳපොළ වටිනාකමට රක්ෂණය කර නොමැතිනම්, ඔබට ලැබෙන වන්දි මුදල, සමාන තත්වයක නව වාහනයක් මිලදී ගැනීමට ප්‍රමාණවත් නොවනු ඇත.

රක්ෂිත මුදල සංශෝධනය කරගැනීම සඳහා ඔබගේ රක්ෂණ අලෙවි නිළධාරියා හෝ 011-2206306 අමතන්න. අප ඔබට සහය වීමට කැමැත්තෙන් සිටිමු.

අප නිරතුරුව ඔබගෙ සේවය වෙනුවෙන් බැඳී සිටින්නෙමු.

මෙයට විශ්වාසී

රථවාහන ප්‍රාරක්ෂණ අංශය